# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2025 අංක 22 දරන
## පෞද්ගලික දත්ත ආරක්ෂණ
## (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2025 ඔක්තෝබර් මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2025 ඔක්තෝබර් මස 31 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 40.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2025 අංක 22 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2025 ඔක්තෝබර් මස 30 වන දින]

එල්.ඩී.- ඕ 6/2025

## 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2025 අංක 22 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (1) (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ 1 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 2022 අංක 9 දරන පනතේ 1 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) මේ වගන්තිය හැර මේ පනතේ අනෙකුත් සියලු විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට හෝ දිනවල සිට ක්‍රියාත්මක විය යුතු ය."; සහ

(ආ) එම වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්ති ඉවත් කිරීමෙන්.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීම නොතකා, මේ වගන්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙර V වන, VI වන, VIII වන, IX වන සහ X වන කොටස් යටතේ යථා පරිදි කරන ලද යම් දෙයක් වලංගු ලෙස සලකනු ලැබිය යුතු අතර අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු ය.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

PL 15225 - 768 (2025/05)

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) 13 වන, 14 වන, 15 වන, 16 වන හෝ 18 වන වගන්තිය යටතේ දත්ත දායකයකුගෙන් පාලකවරයකු වෙත ලිඛිත ඉල්ලීමක් ලැබුණු විට දී, එම පාලකවරයා විසින්, එම ඉල්ලීම ලැබීමේ දින සිට අයුතු ප්‍රමාදයකින් තොරව සහ එක් මාසයක් ඇතුළත -

(අ) එම ඉල්ලීම ප්‍රදානය කර ඇති ද යන්න; හෝ

(ආ) යම් ලිඛිත නීතියක් මගින් එම හේතු අනාවරණය කිරීම තහනම් කර ඇත්නම් මිස, ඒ සඳහා වන හේතු සහිතව එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති ද යන්න,

එම දත්ත දායකයාට ලිඛිතව දැනුම් දිය යුතු ය.";

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(1අ) පාලකවරයකුට, තත්කාර්ය සඳහා දක්වනු ලබන හේතු මත (1) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව දීර්ඝ කිරීමක් අවශ්‍ය වන අවස්ථාවක දී, එම ඉල්ලීම ලැබීමේ දින සිට මාස තුනක් නොඉක්මවන පරිදි, එම කාලසීමාව තවදුරටත් වූ මාස දෙකක කාලසීමාවක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(1ආ) (1) වන උපවගන්තිය යටතේ කාලසීමාව දීර්ඝ කරනු ලබන අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ සඳහන් මාස එකක කාලසීමාව අවසන් වීමට පෙරාතුව, පාලකවරයා විසින් එම දීර්ඝ කිරීම පිළිබඳව දත්ත දායකයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(1ඇ) 13 වන, 14 වන, 15 වන, 16 වන හෝ 18 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අධිකාරියට අභියාචනා කිරීමේ අයිතිය පිළිබඳව පාලකවරයකු විසින් දත්ත දායකයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.";

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ, "13 වන, 14 වන, 15 වන හෝ 16 වන වගන්ති" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "13 වන, 14 වන, 15 වන, 16 වන හෝ 18 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) එම වගන්තියේ (4) වන උපවගන්තියේ, "13 වන, 14 වන, 15 වන හෝ 16 වන වගන්ති" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "13 වන, 14 වන, 15 වන, 16 වන හෝ 18 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(5) එම වගන්තියේ (5) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ, "උරුමකරුවකු විසින්," යන වචන වෙනුවට, "උරුමකරුවකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

(6) එම වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(6) 13 වන, 14 වන, 15 වන, 16 වන හෝ 18 වන වගන්තිය යටතේ දත්ත දායකයකු විසින් කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධයෙන්, පාලකවරයා විසින් ගාස්තු අය කිරීමකින් තොරව ක්‍රියා කළ යුතු ය:

එසේ වුව ද, එවැනි ඉල්ලීමක් බලාත්මක කිරීම සඳහා පාලකවරයකු විසින් ගාස්තුවක් අය කරනු ලැබිය හැකි අතර ඒ ගාස්තු අය කරනු ලැබිය හැකි වනුයේ කවර නිර්ණායක හෝ අවස්ථානුගත කරුණු යටතේ ද යන්න, අධිකාරිය විසින් රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ය."; සහ

(7) එම වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් ලිඛිත නීතියක් යටතේ" යන වචන වෙනුවට, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ යම් ලිඛිත නීතියක් යටතේ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (1) වන, (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) පාලකවරයකු විසින් -

(අ) 13 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත වෙත ප්‍රවේශය ලබා දීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී;

(ආ) 14(1) වන වගන්තිය යටතේ කැමැත්ත ඉල්ලා අස්කර ගැනීම සඳහා ඉඩ ලබා දීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී හෝ 14(2) වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත වැඩිදුර සැකසීමෙන් වැළකී සිටීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී;

(ඇ) 15 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත නිවැරදි කිරීම හෝ සම්පූර්ණ කිරීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී;

(ඈ) 16 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත මකා දැමීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී;

(ඉ) 17(2) වන වගන්තිය යටතේ දත්ත දායකයාගේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී; හෝ

(ඊ) 18(1) වන වගන්තිය යටතේ ස්වයංක්‍රීය දත්ත සැකසීම මත පමණක් පදනම් වූ තීරණයක් සමාලෝචනය කිරීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී,

දත්ත දායකයා විසින්, එම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව, නියම කරනු ලැබිය හැකි ආකෘතියකින්, ආකාරයකින් සහ යම් කාලසීමාවක් ඇතුළත අධිකාරිය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ලැබීමෙන් පසුව -

(අ) 13 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත වෙත ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ පාලකවරයාගේ තීරණය නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ආ) 14(1) වන වගන්තිය යටතේ කැමැත්ත ඉල්ලා අස්කර ගැනීම සඳහා ඉඩ ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට හෝ 14(2) වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත තවදුරටත් සැකසීමෙන් වැළකී නොසිටීමට වූ පාලකවරයාගේ තීරණය නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ඇ) 15 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත නිවැරදි කිරීම හෝ සම්පූර්ණ කිරීම ප්‍රතික්ෂේප කිරීමට ගත් පාලකවරයාගේ තීරණය නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ඈ) 16 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත මකා දැමීම ප්‍රතික්ෂේප කිරීමට ගත් පාලකවරයාගේ තීරණය නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ඉ) 17(2) වන වගන්තිය යටතේ පාලකවරයා සිදු කළ ප්‍රතික්ෂේප කිරීම නීත්‍යානුකූල වූයේ ද යන්න; හෝ

(ඊ) 18(1) වන වගන්තිය යටතේ ස්වයංක්‍රීය දත්ත සැකසීම මත පමණක් පදනම් වූ තීරණයක් සමාලෝචනය කිරීම සඳහා වූ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම නීත්‍යානුකූල වූයේ ද යන්න,

තීරණය කිරීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ලැබීමෙන් පසුව සහ අවශ්‍ය විමර්ශන සිදුකර අවසන් කිරීමෙන් පසුව, නියම කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත, අධිකාරිය විසින් -

(අ) අභියාචනය සඳහා ඉඩ ලබා දෙන්නේ ද යන්න; හෝ

(ආ) තත්කාර්යය සඳහා හේතු දක්වමින් අභියාචනය සඳහා ඉඩ ලබා නොදෙන්නේ ද යන්න,

තීරණය කරනු ලැබිය යුතු අතර, අධිකාරිය විසින්, ඒ තීරණය දත්ත දායකයාට සහ පාලකවරයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) (අ) ඡේදයේ ''අමාත්‍යාංශයක් රජයේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින්'' යන වචන වෙනුවට, ''අමාත්‍යාංශයක් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් විසින්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) (ආ) ඡේදයේ (iii) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:-

''(iii) මේ පනත යටතේ සාදනු ලබන මාර්ගෝපදේශ මගින් අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි, දත්ත සැකසීමේ ස්වභාවය සහ දත්ත දායකයා මත ඉන් ඇතිවන බලපෑම මත පදනම්ව, මේ පනත යටතේ ආරක්ෂා කරනු ලැබ ඇති දත්ත දායකයන්ගේ අයිතිවාසිකම්වලට බලපෑම් කරනු ලබන හානියක් පිළිබඳ අවදානමක් සහිත ප්‍රතිඵල ඇති කරන්නා වූ දත්ත සැකසීමේ ප්‍රභේද සම්බන්ධයෙන් වන විට දී.''; සහ

(2) එම වගන්තියේ (5) වන උපවගන්තියේ-

(අ) (අ) ඡේදයේ, ''මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ විධිවිධාන සලස්වන ලද දත්ත සැකසීමේ නියමයන්'', යන වචන වෙනුවට, ''මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන, අවස්ථාවෝචිත පරිදි, දත්ත සැකසීමේ බැඳීම් හෝ නියමයන්'' යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව පාලකවරයාට හෝ දත්ත සකසන්නාට උපදෙස් දීම;"; සහ

(ඇ) (ඉ) ඡේදයේ, "දත්ත ආරක්ෂණයට" යන වචන වෙනුවට "පෞද්ගලික දත්ත ආරක්ෂණයට" යන වචන ආදේශ කිරීමෙන්.

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියේ, "දත්ත ආරක්ෂණ නිලධරයකු නම් කරනු ලැබ ඇති අවස්ථාවක පාලකවරයා විසින් එම දත්ත ආරක්ෂණ නිලධරයාගේ" යන වචන වෙනුවට,"පාලකවරයා විසින් දත්ත ආරක්ෂණ නිලධරයාගේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(5) අධිකාරිය විසින් ලිඛිත ඉල්ලීමක් කිරීමෙන් පසු, මේ වගන්තිය යටතේ සිදු කිරීමට නියම කරනු ලැබ ඇති දත්ත ආරක්ෂණ බලපෑම ඇගැයීමක්, පාලකවරයා විසින්, අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු අතර, අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි එම ඇගැයීමට අදාළ වෙනත් යම් තොරතුරු ද සපයනු ලැබිය යුතු ය.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ, "මේ පනත යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ" යන වචන වෙනුවට, "මේ පනත යටතේ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන, (3) වන, (4) වන, (5) වන සහ (6) වන උපවගන්ති ඉවත් කිරීමෙන්;

(3) එම වගන්තියේ (7) වන උපවගන්තියේ, "පාලකවරයා විසින් 24(1) වන වගන්තියේ දක්වා ඇති පෞද්ගලික දත්ත සැකසීමෙහි නිරත වන ඕනෑම අවස්ථාවක සහ ජාතික ආරක්ෂාවට, මහජන සාමයට සහ මහජන සෞඛ්‍යයට අදාළව දත්ත සැකසීම සිදු කරනු ලබන අවස්ථාවක දී," යන වචන සහ ඉලක්කම් වෙනුවට, "පාලකවරයකු විසින් 24(1) වන වගන්තියේ දක්වා ඇති පෞද්ගලික දත්ත සැකසීමෙහි නිරත වන ඕනෑම අවස්ථාවක දී, එම දත්ත සැකසීම, ජාතික ආරක්ෂාවට, මහජන සාමයට සහ මහජන සෞඛ්‍යයට අදාළව සිදු කරනු ලබන්නේ නම්," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(4) එම වගන්තියේ පැති සටහනේ "ලිහිල් කිරීම සඳහා වන පියවර සහ පූර්ව උපදේශනයේ අවශ්‍යතාවය" යන වචන වෙනුවට "ලිහිල් කිරීම සඳහා වන පියවර" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"පෞද්ගලික දත්ත දේශසීමා හරහා සංචලනය

**26.** (1) පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින්, අවස්ථාවෝචිත පරිදි, I වන කොටසේ, II වන කොටසේ සහ 20 වන, 21 වන, 22 වන, 23 වන, 24 වන සහ 25 වන වගන්තිවල විධිවිධාන සමඟ අනුකූල වීම සහතික කරනු ලබන අවස්ථාවක දී පමණක්, එම පාලකවරයාට හෝ දත්ත සකසන්නාට පෞද්ගලික දත්ත දේශ සීමා හරහා සංචලනවල නිරත විය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ අනුකූල වීම සහතික කිරීමේ කාර්යය සඳහා, මේ පනත යටතේ ලබා දී ඇති දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම සඳහා උචිත ආරක්ෂණයන් සහතික කර ගැනීම පිණිස තෙවන රටක සිටින ප්‍රතිග්‍රාහකයාගේ බැඳීම සහ බලාත්මක කළ හැකි කැපවීම්

සහතික කර ගැනීම සඳහා, 33 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ අධිකාරිය විසින් නිකුත් කරන ලද විධානයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නීතිමය ලියවිලි, පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් පිළිගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද-

(අ) දත්ත දායකයාට එම දත්ත සැකසීමෙන් සිදු විය හැකි අවදානම පිළිබඳ දැනුවත් කිරීමෙන් පසුව, යෝජිත පෞද්ගලික දත්ත දේශ සීමා හරහා සංචලනය සඳහා දත්ත දායකයා විසින් ප්‍රකාශිතව ම කැමැත්ත ලබා දී ඇත්නම්;

(ආ) දත්ත දායකයා සහ පාලකවරයා අතර ගිවිසුමක් ඉටු කිරීම සඳහා හෝ දත්ත දායකයාගේ ඉල්ලීමක් මත පාලකවරයා විසින් ගනු ලැබ ඇති යම් පූර්ව ගිවිසුම්ගත පියවර ක්‍රියාත්මක කිරීම සඳහා දත්ත පැවරීම අවශ්‍ය වේ නම්;

(ඇ) දත්ත දායකයාට අදාළ නෛතික හිමිකම්පෑම් ප්‍රතිෂ්ඨාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ එම හිමිකම්පෑම්වල විත්තිවාචික සඳහා දත්ත පැවරීම අවශ්‍ය වේ නම්;

(ඈ) මේ පනතේ I වන උපලේඛනයේ (උ) අයිතමයේ අර්ථ නිරූපණය කර ඇති පරිදි මහජන යහපත පිණිස වූ හේතු සඳහා දත්ත පැවරීම අවශ්‍ය වේ නම්;

(ඉ) දත්ත දායකයාගේ ජීවිතය, සෞඛ්‍යය හෝ ආරක්ෂාව සඳහා තර්ජනයක්

වන යම් හදිසි අවස්ථාවක් සඳහා ප්‍රතිචාර දැක්වීමට දත්ත පැවරීම අවශ්‍ය වේ නම් හෝ ඔහුගේ නෛතික භාරකරු,ශාරීරික හෝ නෛතික වශයෙන් කැමැත්ත ලබා දීමට නොහැකිව සිටින අවස්ථාවක දී;

(ඊ) දත්ත පැවරීම, ශ්‍රී ලංකාව හරහා පෞද්ගලික දත්ත සංක්‍රමණය කිරීමක් පමණක් සංස්ථාපනය කරනු ලබන්නේ නම්; හෝ

(උ) මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් තත්ත්වයන් යටතේ එම දත්ත සැකසීම සඳහා අවසර ලබා දී ඇත්නම්,

පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් පෞද්ගලික දත්ත දේශ සීමා හරහා සංචලනයෙහි නිරත වනු ලැබිය හැකි ය.

(4) පොදු අධිකාරියක් වන පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින්, (5) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි පෞද්ගලික දත්ත ප්‍රභේද සම්බන්ධයෙන් දේශ සීමා හරහා පෞද්ගලික දත්ත සංචලනවල නිරත නොවිය යුතු ය.

(5) අධිකාරිය විසින් හෝ අදාළ ව්‍යවස්ථාපිත හෝ නියාමන ආයතනය විමසා පොදු අධිකාරියක් වන පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් ඉල්ලීමක් කිරීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, (4) වන උපවගන්තියේ කාර්ය සඳහා පෞද්ගලික දත්ත ප්‍රභේද නියම කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**11**. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 51අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“මාර්ගෝපදේශ **51අ.** අධිකාරිය විසින්, කලින් කල, 33 වන වගන්තියේ (ච) ඡේදයේ සඳහන්, උපදේශක කමිටු විසින් සකස් කරනු ලබන සහ අධිකාරිය විසින් අනුමත කරනු ලබන ආංශික මාර්ගෝපදේශ සහ 12 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහනට අදාළ කාරණා ද ඇතුළුව, මේ පනතේ නිශ්චිතව දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය හැකි ය.”.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (2) වන උපවගන්තියේ “මාස විසි හතරක් තුළ,” යන වචන වෙනුවට “මාස තිස් හයක් තුළ,” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) “දත්ත ආරක්ෂණ නිලධරයා” යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

““දත්ත ආරක්ෂණ නිලධරයා” යන්නෙන්, 20 වන වගන්තිය යටතේ නම් කරන ලද හෝ පත් කරන ලද තැනැත්තා අදහස් වන අතර එයට පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් සෘජුව ම සේවයේ නොයෙදවූ, එහෙත් 20(5) වන වගන්තිය යටතේ වන වගකීම් සපුරාලනු ලබන තෙවන පාර්ශ්වයක් ද ඇතුළත් වේ;”;

(2) “පොදු අධිකාරිය” යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

"''පොදු අධිකාරිය'' යන්නෙන්, අමාත්‍යාංශයක්, යම් දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක් හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් අදහස් වන නමුත්:-

(අ) රජයේ සංස්ථාවක්; හෝ

(ආ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක්,

ඇතුළත් නොවේ;''; සහ

(3) ''තෙවන රට'' යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

"''තෙවන රට'' යන්නෙන්, ශ්‍රී ලංකාව හැර වෙනත් යම් දේශ භූමියක් හෝ රටක් අදහස් වේ;''.

ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන උපලේඛනය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන උපලේඛනයේ 6 වන අයිතමයේ (2) වන ඡේදයේ ''අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්'' යන වචන වෙනුවට ''සභාපතිවරයා විසින්'' යන වචන ආදේශ කිරීමෙන් එම උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.